තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

එස්.එච්. චන්ද්‍රසේන එ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සියඹලාණ්ඩුව

RTIC Appeal (**ලේඛනගත කාර්යපටිපාටිය**)/ **137** /**2017** 02.03.2018 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්ය්‍ය පටිපාටිය )**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්ය්‍යර පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - එස්.එච්. චන්ද්‍රසේන
**නොතිසි ලත් පාර්ශවය** - ප්‍රාදේශීය ලේකම් , ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , සියඹලාණ්ඩුව

**පෙනීසිටීම**
මෙම අභියාචනය පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු කියාපෑම මත සලකා බලන ලදි.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 17.04.2017 |
| තොරතුරු නිළධාරියා තීරණය ලබා දුන් දිනය | 25.05.2017 |
| නම් කල නිළධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 13.06.2017 |
| නම් කල නිළධාරියා තීරණය ලබා දුන් දිනය | (කිසිඳු ප්‍රතිචාරයක් නැත) |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 02.08.2017 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 17.04.2017 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

**මුතුකණ්ඩිය වාරිමාර්ග යෝජනා ක්‍රමය යටතේ සංවර්ධනය කොට වගා කටයුතු සඳහා අභියාචක වෙත ලබා දී ඇති 452 අංක දරණ කුඹුරු ඉඩම සම්බන්ධයෙන් සියඹලාණ්ඩුව ප්‍රාවදේශීය ලේකම් කාර්යාලයේ ගොණුවේ ඇති සියළුම ලේඛනවල සහතික කළ පිටපත් . ( නමුත් මෙම තොරතුරු ඉල්ලීමේ පිටපතක් අභියාචනයට අමුණා නැත)**

තොරතුරු නිලධාරියා 25.05.2017 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(02) වන වගන්තිය යටතේ 1988.02.25 දිනැතිව මුතුකණ්ඩිය ව්‍යාපාරයේ 06 වන ගම්මානයෙහි පිහිටි අක්කර 02 රූඩ් 02ක් පමණ වූ මඩ ඉඩම සඳහා අභියාචකට අවසර පත්‍රයක් ලබා දී ඇත. 2001 වසරේ අභියාචක විසින් එම අවසර පත්‍රය නීත්‍යානුකූල නොවන පරිඩි එම් .එච්. මැටිල්ඩා ප්‍රියංගනී යන අයට පවරා රුපියල් ලක්ෂ තුනක මුදලක් ලබාගත් බව අභියාචක පිළිගන්නා බවත් ඒ අනුව අවසර පත්‍රයේ 13 වගන්තිය වන "අවසර පත්‍රලාභීරන්නා විසින් ඉඩම පැවරීම හෝ බැහැර කිරීම නොකළ යුතුයි" යන කොන්දේසිය අභියාචක විසින් කඩකර ඇති අතර පසුව මැටිල්ඩා ප්‍රියංගනී විසින්

ද එකී කුඹුරු ඉඩම අර්.එම්.මුතුබණ්ඩා හට නීත්‍යානුකූල නොවන පරිදි පැවරුම් කර ඇති බවයි . අදාළ කාලසීමාව වන විටත් අභියාචක වසමෙන් පදිංචිය හැර ගොස් ඇති අතර 2006 වසරේ සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී, අනාවර්ණය වී ඇති කරුණු පදනම් කරගෙන 109 වගන්තිය ප්‍රකාරව අදාළ කුඹුරු ඉඩම සඳහා අභියාචක වෙත ලබා දී ඇති බලපත්‍රය අවලංගු කර ඇති බව කාර්යාල පිටපත අනුව අනුව නිරීක්ෂණය වන බවත් ඒ අනුව එම කුඹුරු ඉඩම සංවර්ධනය කරමින් මේ දක්වා භුක්ති විඳිනු ලබන ආර්.එම්.මුතුබණ්ඩාගේ වැඩිමහල් පුතු වන ආර්.එම්. දයානන්ද යන අය බලපත්‍රයක් ලබා ගැනීම පිණිස 2016.06.06 දින පැවති මූලික පරීක්ෂණයටද ඉදිරිපත් වී ඇති බවයි . ඒ අනුව ඉහත බලපත්‍රය සඳහා තවදුරටත් අභියාචක හට හිමිකමක් නොමැති බව දන්වා තිබේ . මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2017.13.06. දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී . නම්කළ නිලධරයාගෙන් ප්‍රතිචාරයක් නොවූ හෙයින් 02.08.2017 දිනැතිව අභියාචක කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

මෙම අභියාචනය පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු කියාපෑම මත සලකා බලන ලදි . ඒ අනුව , සියඹලාණ්ඩුව, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ අංක Mo/Syb/Lnd/09/0103-i හා 2017.12.18 දිනැති ලිපිය මඟින් සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් වරයා දන්වා සිටින පරිදි,

1. මෙම කොට්ඨාසයේ සියඹලාණ්ඩුව පොතුවිල් පාර , 20 කණුව ලිපිනය යොදා ඇති අභියාචක හට මුතුකණ්ඩිය ව්‍යාපාරයේ 06 වන ගම්මානයේ අංක 452 දරණ මඩ ඉඩම සඳහා අංක 186 දරණ බලපත්‍රයක් 1998.02.25 දිනැතිව මොණරාගල දිසා විසින් ලබා දී ඇත.
2. 1993 වසරේ සිට මෙම කොට්ඨාසයේ පදිංචිය නොමැති චන්ද්‍ර සේන මහතා 2005 වර්ෂයේදී මෙම කුඹුර නීත්‍යනුකූල නොවන ආකාරයට සියඹලාණ්ඩුව පොතුවිල් පාර "ඇසල සෙවනේ" එම්.එච්. මැටිල්ඩා ප්‍රිශාන්ගනී යන අයට පවරා ඇති බවට සාක්ෂි හමු වී ඇත . අභියාචක තම බලපත්‍රය අස්ථානගත වී ඇති බවට 2017.03.16 දින සියඹලාණ්ඩුව පොලීසියට ලබා දී ඇති ප්‍රකාශය අනුව ඔහු මෙම කොට්ඨාසයේ පදිංචි බවත්, තිස්සමහාරාම ප්‍රදේශයේ දී තම බලපත්‍රය අස්ථානගත වූ බවටත් ප්‍රකාශ කර ඇත.
3. තවද මේ සම්බන්ධයෙන් කාර්යාලය සතු ලිපිගොණුව පරීක්ෂා කිරීමේදී බලපත්‍රියේ කොන්දේසි කඩකිරීම හේතුවෙන් එවකට සිටි බලධාරීන් විසින් ඉඩම් කාර්යය සංග්‍රහයේ 106 සහ 109 වගන්ති ප්‍රකාරව එම බලපත්‍රය අවලංගු කර ඇත . ( පිළිවෙලින් 2006.01.11 හා 2006.02.22 දිනයන් හි)
4. අභියාචකගේ බලපත්‍රය අවලංගු කිරීමට ගත් තීරණයේ පිටපතක් එම ලිපි බෙදා දීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුවට යොමුකල බවට සාක්ෂි විමසා තිබූ අතර , වසර 11ක් පමණ ඉහත දී වූ සිදුවීමක් බැවින් ඊට අදාළ ලිපිගොණු කාර්යාලයේ දැනට සොයා ගැනීමට නොහැකිය . නමුත් බලපත්‍රයේ කාර්යාල පිටපත දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පවතී.
5. අභියාචක සිය බලපත්‍රය අන්සතු කිරීමෙන් පසු මැටිල්ඩා ප්‍රිතයන්ගනී යන අය අර්.එම්.මුතුබණ්ඩා යන අයට නැවත විකුණා ඇති බව ඉදිරිපත් කර ඇති ලේඛන අනුව ඒ බව සනාථ වේ. ඒ අනුව කුඹුරු ඉඩම සංවර්ධනය කරනු ලබන ආර්.එම්.මුතුබණ්ඩා මහතාගේ පුතා වන ආර්.එම්. දයානන්ද මහතා 2016.06.06 දින පැවති මූලික ඉඩම් සමීක්ෂණයට ඉදිරිපත් වී ඇති බවද දන්වා සිටී.
6. මේ සම්බන්ධයෙන් සියඹලාණ්ඩුව ප්‍රා දේශීය ලේකම්ගේ සමාංක හා 2017.07.31 දිනැති ලිපියෙන් කොමිසමෙන් උපදෙස් ඉලා ඇති අතර කොමිසමේ අංක RTIC/25/2017 හා 2017.09.14 දිනැති ලිපියෙන් උපදෙස් ලබා දී ඇත . තවද සියඹලාණ්ඩු ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පවතින පහත සඳහන් ලේඛනවල මෙම ලිපියට අමුණා ඇත.

   i. බලපත්‍රයේ කාර්යාල පිටපතේ ඡායා පිටපතක්
   ii. 2017.03.16 දිනැති පොලිස් පැමිණිල්ලේ ඡායා පිටපතක්
   iii. කුඹුරු ඉඩම අන්සතු කළ බවට ඉදිරිපත් කර ඇති 2005.10.06 දිනැති ගිවිසුමේ පිටපතක්
   iv. 2017.12.04 දිනැති අභියාචකගේ ප්‍රකාශයේ පිටපතක්

v. එච්.එම්. මැටිල්ඩා ප්‍රියංගනී මහත්මියගේ ප්‍රකාශයේ ඡායා පිටපතක්
vi. ආර්.එම්. මුතුබණ්ඩා මහතාගේ ප්‍රකාශයේ ඡායා පිටපතක්
vii. 2005.10.06 දිනැති අත් කුවිතාන්සියේ ඡායා පිටපතක්
viii. අභියාචක ශ්‍රී ජිතපුර වසමේ පදිංචි නොමැති බවට ග්‍රාම නිලධාරී වාර්තාවේ ඡායා පිටපතක්
ix. අංක 452 කුඹුරු ඉඩමට පොහොර ලබාගත් අය පිළිබඳ විස්තර

**නියෝගය:**
සියඹලාණ්ඩුව, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ අංක Mo/Syb/Lnd/09/0103-i හා 2017.12.18 දිනැති ලිපිය මඟින් හා ඊට අමුණා ඇති ලේඛන මඟින් ප්‍රකමාණවත් ලෙස තොරතුරු දී ඇති බැවින් අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි , රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය , ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කිරීමට නියෝග කර සිටිමු.

*****